# ප්‍රසම්පාදන දැන්වීමයි

## රත්නපුර මහා නගර සභාව

පහත සඳහන් වැඩ විෂය සඳහා රත්නපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් **2025/09/30** වන දින පෙ.ව. **11.00** දක්වා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ලංසු භාර ගැනේ.

| අනු අංකය | වැඩ විෂයය | කොන්ත්‍රාත් ලියාපදිංචි ශ්‍රේණිය | ලියාපදිංචි ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කරය (රු) | දළ ඇස්තමේන්තු වැඩ වටිනාකම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| **1.** | **දෙමුවාවත මැණික් වීදියේ වැසිකිලි පද්ධතිය නවීකරණය කිරීම** | **C6 සහ ඉහළ** | ගොඩනැගිලි | **5000.00** | **255,000.00** | **17.06** |
| **2.** | **රත්නපුර පල්ලිය පාරේ වාහන නැවතුම්පොළ අසල පොදු වැසිකිලි පද්ධතිය ඉදි කිරීම** | **C7 සහ ඉහළ** | ගොඩනැගිලි | **3500.00** | **145,000.00** | **9.61** |
| **3.** | **රත්නපුර කණාදොල කසල කළමණාකරණ මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම** | **C8 සහ ඉහළ** | මාර්ග | **2000.00** | **75,000.00** | **5.0** |

01. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ක්‍රියා පටිපාටිය යටතේ සිදුකරනු ලබන අතර, මෙම කර්මාන්තයන්ට අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමුව පළාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරාගැනීම සිදුකරනු ලැබේ.

02. ඉහත වැඩ විෂයන්ට අදාල ලංසුපත් **2025/09/16** දින සිට **2025/09/29** දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර ගාස්තු රත්නපුර මහා නගර සභාවට මුදලින් ගෙවා ලබාගත යුතුය.

03. සියළුම ලංසුකරුවන් එක් එක් ඉදි කිරීම් සඳහා එම කර්මාන්තයට ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් **2025/09/29** දින සිට **2026/01/12** දින දක්වා වලංගු වන පරිදි "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, රත්නපුර" ප්‍රතිලාභියා ලෙස නම් කර ලබා ගත් ලංසු බැඳුම්කරයක් මගින් හෝ අදාල කර්මාන්තය නමින් ලංසු සුරක්ෂණ මුදල ලෙස රත්නපුර මහා නගර සභාවේ අදාල මුදල් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සි වල මුල් පිටපත් ලංසු ලේඛන සමග ඉදිරිපත් කල යුතුය.

04. මෙම කර්මාන්තය පිළිබඳ විස්තර රත්නපුර මහා නගර සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 045-2222275/045-2225818/045-3122714 වෙතින් කාර්යාල වේලාවන් තුළදී ලබා ගත හැකිය. අවශ්‍යය අයෙකුට සතියේ වැඩකරන දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය.

05. මුද්‍රා තබන ලද ලංසු **2025/09/30** වන දින පෙ.ව. **11.00** ට හෝ ඊට පෙර රත්නපුර මහා නගර සභා කාර්යාලයේ මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම හෝ "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, රත්නපුර"යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු මුල් පිටපත හා අනුපිටපත වශයෙන් වෙනම කවරවල බහා ඒ පිටපත් දෙකම එක් කවරයක බහා එම කවරයේ වම් පස ඉහල කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

06. **2025/09/30** වන දින පෙ.ව. **11.30** ට රත්නපුර මහා නගර සභා කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

07. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රත්නපුර මහා නගර සභා ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

08. සියළුම ලංසු **2025.12.15** වන දින දක්වා වලංගු විය යුතුය.

,

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
මහා නගර සභාව,
රත්නපුර
**2025.09.10**

# ලංසු කැඳවීමේ ආරාධනා

# රත්නපුර මහා නගර සභාව

රත්නපුර මහා නගර සභාවේ මාර්ග හා ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසුකම් ඇති හා හැකියාව ඇති ලංසුකරුවන්ගෙන් රත්නපුර මහා නගර සභා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

- වැඩි විස්තර www.ratnapura.mc.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.
- මෙම කර්මාන්ත පිළිබඳ විස්තර රත්නපුර මහා නගර සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 045-2222275/045-2223502/ 045-3122714 වෙතින් කාර්යාල වේලාවන් තුළදී ලබා ගත හැකිය.අවශ්‍ය අයෙකුට නොමිලේ සතියේ වැඩ කරන දිනයන්හීදී ලංසු ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.
- 2025.09.29 දින දක්වා ලංසුපත් නිකුත් කරනු ලැබේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
මහා නගර සභාව,
රත්නපුර.

045-2222275

2025.09.10 දින